# බාධක ජයගත් විශ්‍රාන්තිය

එච්.එම්.එස්.එම්. ජයතිලක

2009 වසරේ රාජ්‍යය සාහිත්‍යය සම්මානය සහ ස්වර්ණ පුස්තක සම්මානය දිනූ සුනේත්‍රා රාජකරුණානායක නම් ලේඛිකාව විසින් පොදු පුරුෂයා නම් කෘතිය රචනා කර ඇත. මවක් දුවක් සහ බෑනකු අතර වන ගැටුමක් සහ ඔවුන්ගේ පෞද්ගලික ජීවිතය ගොඩනැගී තිබුණු ආකාරය මෙම කෘතියෙන් ගෙනහැර දක්වයි. වත්මන් ජීවිතයට මුහුණදෙමින් සිටින අවස්ථාවක නැන්දම්මා හා බෑනා අතර ඇතිවන ගැටුම්කාරී තත්වයත් දුව හා මව අතර පවතින නොකැලැල් මාතෘ සෙනෙහසත් මැද වර්ණාසි මෙම දෙදෙනාටම මැදිව ජීවිතයට සාර්ථකව මුහුණ දෙන ආකාරය රසවත් ආකාරයෙන් ඉදිරිපත් කිරීමට ඇය සමත්වී ඇත. මෙවන් පසුබිමක ඔවුනගේ ජීවිත තුළට විශ්‍රාන්තිය සොයාගියේ කෙසේදැයි විමසා බලමු.

ඒ රාත්‍රිය ආරම්භයේ ඉඳලා මැදියම් රැය දක්වා විස්කි හරි ජින් හරි පානය කරමින් හිටිය බ්‍රිතාන්‍යය, ජර්මනිය ස්වීස්, නොර්වේජියානු හා වෙනත් යුරෝපීය මිනිසුන්ටත් ඒක එහෙම වෙන්න ඇති....කොළඹින් ප්‍රේමවන්තියක් කැන්දගෙන ආවොත් මිසක් කිලිනොච්චි රාත්‍රියක කාමෝන්මාදයක් අපේක්ෂා කරන්න අමාරුයි. දේශපාලන ව්‍යාපාරයත් වෙනත් ආදායම් මාර්ගත් නිසා පැදුන සබඳතා අතර මට ස්ත්‍රීන්ගේ හිඟයක් නම් තිබුණේ නෑ. මං උපදේශක සේවා සැපයූ යුරෝපා සංවිධානයෙන් කුලියට ගත්තු ඒ ගෙදරත් අවට වෙනත් ගෙවල්වලත් වරින් වර සුදු ගෑණු කීපදෙනෙක්ම නැවතිලා හිටියත් ඒ ඇත්තියන්ට ලැබිය යුතු ගරුත්වයත් ආරක්ෂාවත් නොබඳව ලැබුණා......ඒ වුනත් කට්ටිය කිලිනොච්චියෙන් කොළඹ ආ වෙලාවට මටත් නිදහස් දවසක් නම් මං හිතාමතාම ඒ අයට අපේ ගෙදරට ආරාධනා කළා. කොළඹ හිතවතුන් හරි වෘත්තීය සබඳතා තියෙන අයට හරි එන්ඩ කිව්වේ සැබෑ ශ්‍රී ලාංකික ආගන්තුක සත්කාරයත්, මිනිස් ඇසුරේ උණුසුමත් විඳින්න සලසා දීමේ හැඟීමක් එක්කය. හරි............ මං වහල උඩට වෙලා සංගීතය අහගෙන අහස දිහා බලාගෙන ඉන්නවා. ජේම්ස්වත් අඬ ගහගෙන උඩට එන්න.....මං නාලා කොළ පාට සරමකුයි........ ජේම්ස්, ඇලන්, රික් එක්ක තව කීප දෙනෙක් විස්කි බොන්න පටන් අරන් තිබුණා. මාත් කොළඹින් ගෙනාපු බෝතලෙයි, කල් තියාගන්න පුළුවන් විදිහට කරාබු නැටි ඔබලා සාදික්කයි ගම්මිරිසුයි දාලා හොඳට රෝස් කරපු හීන් මස් පෙති ටින් එකයි අරගෙන ආවා......මං තුන්වෙනි විස්කි වීඳුරු වත් වත් කර ගත්තා. ජේම්ස් චිත්‍රපටයක් පෙන්නන්න කටයුතු සූදානම් කරමින් දකුණු පැත්තේ බිත්තිය ළඟ තිරයක් එල්ලමින් හිටියා......අද ඇලන් සිංදු කියන එකක් නෑ. ඒ ගොල්ලෝ චිත්‍රපටයක් බලන්න ගනී. දැන් තව කට්ටිය ඇවිත් ඇති......අපි වහලේ උඩට ගිහින් සිංදු කියමු.....ඒ පාර සාෂා හිනාවෙලා එයාගේ විශාල ඇස් දෙකෙන් වර්ණාසිව මංමත් කරවමින් මූණ ගෑවෙන තරමට කිට්ටු කරගෙන උරහිස් මිරිකගෙන විනාඩි පහක් විතර නොසෙල්වී හිටියා. හැමදාමත් වෙනවා වගේ වර්ණාසි ඒ බැල්මට පරාජය වෙලා සාෂාගේ පපුවේ ඔළුව තියාගෙන එයාගේ හෘද ස්පන්දනය අහගෙන හිටියා......... ලියෝන් එක්ක නාට්‍යය බැලීම පොත් හුවමාරු කර ගැනීම නාට්‍ය ව්‍යාපෘතිය කරගෙන යාමට අමතරව ලියොන්ට තීරු ලිපියක් ලියන්න උදව් කිරීමත් සිද්ධ වුණා......වර්ණාසි ආ වෙලාවට සාමාන්‍යය විදිහට ප්‍රියා ගැන භාග්‍යයා ගැන තැපැල් මාමලාගේ විස්තර කෑම,බීම ගැන ඇඳුම් මෝස්තර දෙන්නම දන්න අඳුනන අය ගැන හෙම කතා කරනවා.

සුනේත්‍රා රාජකරුණානායක, (2014), පොඳු පුරුෂයා, දහවන මුද්‍රණය, සරසවි ප්‍රකාශකයෝ, 1/3, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ. ISBN 978-955-573-700-5